# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
# அரச கணக்குகள் திணைக்களம்
# Department of State Accounts


| මගේ අංකය / எனது இல. / My No. | SA/MAA/02/01/03 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2024.11.20 |
|---|---|---|---|---|---|

**රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක : 05/2024**

**<u>රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි II කොටසෙහි 09 ඡේදයේ ඇතුළත් මු.රෙ. 429 යටතේ 2024 වසර සඳහා භාණ්ඩාගාර පොත් පියවීමට අදාළ මාර්ගෝපදේශ නිකුත්කිරීම</u>**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි 47(2) වගන්තිය අනුව අයවැය අස්ථිත්ව විසින් අදාළ ලිඛිත නීතිවල නිශ්චිතව දක්වා ඇති ආකාරයට සහ අදාළ කාල සීමා තුළදී අවශ්‍ය විස්තර සහිතව වාර්ෂික මූල්‍ය ප්‍රකාශය පිළියෙල කර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු ය.

තව ද, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 15 වන වගන්තිය අනුව රජයේ මූල්‍ය ප්‍රකාශන එක් එක් මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් (03) ඉකුත්වීමට පෙර භාණ්ඩාගාර ලේකම්වරයා විසින් විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. විගණකාධිපති විසින් රජයේ මූල්‍ය ප්‍රකාශන විගණනය එහි අන්තර්ගත වූ සෑම වියදම් ශීර්ෂයක් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් තොරතුරු මත සිදුකරනු ඇත. මෙම කාර්යය සඳහා ජාතික විගණන පනතේ 16(2) වන වගන්තියෙන් නියම කර ඇති පරිදි වාර්ෂික විසර්ජන පනත මගින් අරමුදල් වෙන්කරනු ලබන සෑම වියදම් ශීර්ෂයක්ම සිය (වාර්ෂික විසර්ජන ගිණුම, ආදායම් ගිණුම සහ අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළ ගිණුම් ඇතුළු) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී විගණනය සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙන පරිදි අදාළ මූල්‍ය ප්‍රකාශන නිශ්චිත කාලසීමාවකදී විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. එබැවින්, සෑම වියදම් ශීර්ෂයකම 2024 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2025 පෙබරවාරි 28 වෙනි දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට හැකිවනු පිණිස 2024 මුදල් වර්ෂය සඳහා වූ පහත සඳහන් ගිණුම් පියවීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු ලැබේ.

තවද, මුදල් රෙගුලාසි 150 ට අනුව, ඒකාබද්ධ අරමුදලින් වියදම් දරනු ලබන ආයතන එම මුදල් රෙගුලාසියේ අවශ්‍යතා ද ආවරණය වන අයුරින් මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් පිළියෙල කළ යුතු වේ. එසේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ උපදෙස් හා ආකෘති පත්‍ර මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී නිකුත් කරනු ඇත.

2023.12.29 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2023 හි ඡේද අංක 04 ප්‍රකාරව විසර්ජන පනත මගින් පළාත් සභා වෙනම වියදම් ඒකක වශයෙන් හඳුනාගැනීම හේතුවෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් අයවැය කටයුතු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් ලෙස පත්කර ඇත.

ඒ අනුව, පළාත් සභා සඳහා ආරම්භ කරනු ලබන අග්‍රිම ගිණුම් අංකය යටතේ භාණ්ඩාගාරය මගින් නිකුත් කරනු ලබන අක්මුදල් සඳහා ද මෙම මාර්ගෝපදේශයේ විධිවිධාන අදාළ වේ.

2. මුදල් රෙගුලාසි අංක 429 අනුව 2024 මුදල් වර්ෂයේ ගිණුම් පොත් 2024 දෙසැම්බර් 31 දිනට පියවිය යුතු අතර අදාළ වර්ෂය සඳහා වන ගිණුම් සාරාංශ, මාරු නියෝග හා අනෙකුත් ගිණුම් වාර්තා නිවැරදිව හා විධිමත්ව මෙම මාර්ගෝපදේශයේ 04 වන ඡේදයේ සඳහන් දිනයන්ට හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු බව අවධාරණය කරනු ලැබේ.

3. පොදු කරුණු

3.1 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ https://newcigas.treasury.gov.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇති ඔබ අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/ පළාත් සභාවේ වැය ශීර්ෂයට අදාළ මාසික ගිණුම් විස්තර පරීක්ෂාකර ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිව වැය විෂයන්ට කරන ලද හර කිරීම් ඇත්නම් ඒවා වහාම නිවැරදි කිරීමට කටයුතු කළ යුතු ය.

3.2 පරිපූරක ගිණුම් සාරාංශ මගින් වෙනත් අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක/ පළාත් සභාවක ගිණුම්වලට අදාළ සටහන් යොදන අවස්ථාවලදී ඒ සඳහා එම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/ පළාත් සභාවේ, පූර්ව අනුමැතිය ලබාගත යුතුවේ.

3.3 සාවද්‍ය ගිණුම් තැබීමක් නිවැරදි කිරීම සඳහා වන ජර්නල් සටහන් භාණ්ඩාගාරයට යොමු කළ යුත්තේ අදාළ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/ පළාත් සභාවේ, සිගාස් (CIGAS) වැඩසටහන මගින් එම ගිණුම් සටහන් නිවැරදි කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවලදී පමණි. එවැනි නිවැරදි කිරීමක් සඳහා මෙම දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබන ජර්නල් සටහන්වල සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී වෙත වගකීම පැවරෙනු ඇත.

3.4 2024 වර්ෂය සඳහා ඒ ඒ ආයතනයට අදාළ අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන මෙම දෙපාර්තමේන්තුවේ https://newcigas.treasury.gov.lk වෙබ් අඩවියට නිකුත් කරනු ලැබේ. 2024 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහතික කරනු ලැබූ අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයන්හි තොරතුරු අනුව පමණක් සකස් කළ යුතු බව විශේෂයෙන් අවධාරණය කෙරේ.

3.5 2024 වර්ෂය තුළ යම් අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් විසින් වෙනත් රජයේ හෝ පෞද්ගලික ආයතනයකින් භාණ්ඩ හා සේවා ලබාගෙන ඇත්නම් ඊට අදාළ බිල්පත් 2024 දෙසැම්බර් 31 වන දින හෝ ඊට පෙර පියවා ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුවේ.

3.6 මු.රෙ. 215(3)(ඇ) අනුව වැය ශීර්ෂයන්හි වසර අවසානයට ඉතිරි ප්‍රතිපාදන තැන්පත් ගිණුම්වලට මාරුකිරීම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත්නම් පමණක් සිදුකරනු ඇත. එසේ අනුමැතිය ලද ඉතිරි ප්‍රතිපාදන මාරුකිරීම් සඳහා නව තැන්පතු ගිණුම් අංකයක් උප ගිණුමක් ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් 2024 වර්ෂය වෙනුවෙන් අදාළ ආයතන වෙත සපයනු ලැබේ. එබැවින් කුමන හේතුවක් නිසාවත් දැනට පවත්වාගෙන යනු ලබන පෙර වර්ෂවලට අදාළ අයවැය ප්‍රතිපාදන මාරු කර ඇති තැන්පත් ගිණුම්වලට හෝ අනෙකුත් තැන්පත්



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

ගිණුම්වලට 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන මාරුකිරීම සිදුනොකල යුතු ය. ඉහත ඉල්ලීම් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදී අදාළ වැය ශීර්ෂයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන තිබේද යන්න තහවුරු කරගත යුතු ය.

3.7 ගිණුම් පියවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට ප්‍රථම අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ/ පළාත් සභාවේ, පොත්වල පෙන්නුම් කෙරෙන සියලුම ගිණුම් 2024 අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයන්හි ගිණුම් තොරතුරු සමඟ සසඳා විෂමතාවයන් නොමැති බවට තහවුරු කරගත යුතු ය.

3.8 මූල්‍ය නොවන වත්කම්හි ගිණුම්මය නිවැරදිතාවය පවත්වා ගැනීම අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වගකීමක් වන අතර ආයතනයේ පොත්වල ශේෂයන් සෑමවිටම භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයෙහි වත්කම් ලෙජර් ශේෂ හා මූල්‍ය නොවන වත්කම් කේවල ශේෂ සමඟ සමාන විය යුතු ය.

3.9 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පහත 04 වන ඡේදයේ දැක්වෙන දින වකවානු අනුව භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කරන බැවින්, නියමිත දින වකවානු තුළ අවසන් ගිණුම් සාරාංශ හා පරිපූරක ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ / ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. එසේ නියමිත දිනට අදාළ ගිණුම් සාරාංශ හා අදාළ අනෙකුත් ගිණුම් වාර්තා ඉදිරිපත් නොකරන ආයතනවල වියදම් අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවලින් හෙළිදරව් නොවනු ඇත. එලෙස අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවලින් නිවැරදි මූල්‍ය තත්ත්වය හෙළිදරව් නොවීම පිළිබඳව විගණකාධිපති විමසුම්වලට ලක්වීම වැළැක්වීම සඳහා නියමිත දින වකවානු තුළ තම වැය ශීර්ෂයේ සියලු වියදම් භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීම සඳහා සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් / ගණන්දීමේ නිලධාරීන් විධිමත් වැඩපිළිවෙලක් සකසා ගත යුතු ය.

4. 2024 මුදල් වර්ෂයේ ගිණුම් පියවීමේ කාර්යය සඳහා වූ ඉදිරි වැඩසටහන

| අනු අංකය | කාර්යය | කාර්යය සම්බන්ධ පැහැදිලි කිරීම් | කාර්යය නිම කළ යුතු නිශ්චිත අවසාන දිනයන් |
|---|---|---|---|
| 4.1 | **2024 වර්ෂයේ මුදල් පොත පියවීම** | මුදල් පොත පියවීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන උපදෙස් අනුව සිදුකල යුතු ය. | **2024 දෙසැම්බර් 31 දින** |



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

| | | | |
|---|---|---|---|
| 4.2 | **2024 දෙසැම්බර් මාසයට අදාළ ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම** | 2024 දෙසැම්බර් මාසයට අදාළ ගනුදෙනු ඇතුළත් ගිණුම් සාරාංශය ඉදිරිපත් කළ යුතු ය. | **රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2024/01 අනුව,**<br><br>**පළමු හා දෙවන උපලේඛණයේ සඳහන් සියලුම ආයතන 2025 ජනවාරි 10 ට පෙර** |
| 4.3 | **2024 වර්ෂයේ දෙසැම්බර් මස භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම** | 2024 දෙසැම්බර් මස ගිණුම් සාරාංශයේ අන්තර්ගත ගනුදෙනු ඇතුළත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන භාණ්ඩාගාර වෙබ් අඩවිය වන **https://newcigas.treasury.gov.lk** හි රාජ්‍ය ගිණුම් වෙබ් පිටුව වෙත මුද්‍රාහරිනු ලැබේ. | **2025 ජනවාරි 17** |
| 4.4 | **පළමු පරිපූරක ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම** | 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ගිණුම් සාරාංශයේ ඇතුළත් කිරීමට නොහැකි වූ ගනුදෙනු පමණක් ඇතුළත් කර **"පළමු පරිපූරක ගිණුම් සාරාංශය"** ඉදිරිපත් කළ යුතු ය. මෙහිදී CIGAS වැඩසටහනෙහි 2024 දෙසැම්බර් මාසය සඳහා වූ මාසික ගිණුම් වැසීමේ ක්‍රියාවලිය (Month End Process) සම්පූර්ණ කිරීමෙන් පසු පමණක් පළමු පරිපූරක ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම සිදුකල යුතු ය. | **2025 ජනවාරි 22 දින හෝ ඊට පෙර** |



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

| | | | |
|---|---|---|---|
| 4.5 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම | සියලුම මූල්‍ය නොවන වත්කම් සඳහා CIGAS වැඩසටහන මගින් ජනනය කරනු ලබන වත්කම් ගොනු (csv file) cigassummary@sad.treasury.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය හරහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය.<br>(i) උප කාර්යාල තිබේ නම්, සියලුම උප කාර්යාල දත්ත ඒකාබද්ධ CIGAS වැඩසටහනට ඇතුළත් කර ඒකාබද්ධ වත්කම් ගොනුව නිර්මාණය කළ යුතු ය.<br>(ii) වත්කම් ගොනුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට පෙර ප්‍රධාන කාර්යාලය මගින් CIGAS පද්ධතියෙන් නිර්මාණය කළ හැකි "අවසන් ගිණුම් වත්කම් වාර්තාවේ" (Cash → Final Acct → Asset_Rpt_ Current Year) ශේෂයන් සමග CIGAS වැඩසටහනේ පාලන ලෙජර් ගිණුම් ශේෂයන් (Cash → Ledger → Show Accounts → Accounts Summary → Assets) එකඟ වේද යන්න පරීක්ෂා කළ යුතු ය.<br>(iii) CIGAS වැඩසටහනේ පාලන ගිණුම් ශේෂ භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල ඇතුළත් පාලන ගිණුම් ශේෂ සමග එකඟ වේ ද යන්න පරීක්ෂා කළ යුතු ය.<br>ඉහත (i), (ii) හා (iii) පරිදි පරීක්ෂා කිරීම් සිදුකර නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව පමණක් වත්කම් ගොනු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු ය.<br>මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ දෘඪ පිටපත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම අවශ්‍ය නොවේ. | **2025 ජනවාරි 24 දින හෝ ඊට පෙර** |



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

| | | | |
|---|---|---|---|
| 4.6 | **පළමු පරිපූරක ගිණුම් සාරාංශ තොරතුරු ද ඇතුළත් කර පළමු පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම** | 2024 දෙසැම්බර් ගිණුම් සාරාංශයෙන් සහ පළමු පරිපූරක ගිණුම් සාරාංශයෙන් වාර්තා කරන ලද සියලු ලැබීම් හා ගෙවීම් හා වැරදි නිවැරදි කිරීම් ඇතුළත් පළමු පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන භාණ්ඩාගාර වෙබ් අඩවිය වන **https://newcigas.treasury.gov.lk** වෙත මුද්‍රාහරිනු ලැබේ. | **2025 ජනවාරි 29** |
| 4.7 | **දෙවන හා අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීමට පෙර මු.රෙ. 69 අයදුම් පත්‍ර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම** | මු.රෙ.69 අයදුම්පත් සඳහා ITMIS පද්ධතිය හරහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු ය. | **2025 ජනවාරි 29 දින හෝ ඊට පෙර** |
| 4.8 | **බැඳීම් හා බැරකම් නව සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කිරීම** | එක් එක් වියදම් ශීර්ෂ විසින් මු.රෙ. 94(1) ට අනුකූලව නව සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කරන ලද බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවක් පළමු භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන සමඟ නිකුත් කරනු ලැබේ. බැඳීම් හා බැරකම් පිළිබඳ තවදුරටත් සිදුකළ යුතු ගැලපීම් තිබේනම් එකී ගැලපීම් සිදුකර භාණ්ඩාගාරය වෙත වාර්තා කළ යුතු ය.<br><br>උප කාර්යාලවල බැඳීම් හා බැරකම් ඒකාබද්ධ සිගාස් (CIGAS) වැඩසටහනට ඇතුළත් කර නැවත පරීක්ෂා කර ප්‍රධාන කාර්යාලය මගින් මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතු ය. මේ සඳහා අදාළ යාවත්කාලීන කළ CIGAS මාර්ගෝපදේශය ඉදිරියේ දී නිකුත් කරනු ඇත.<br><br>බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවේ දෘඪ පිටපත්/මෘදු පිටපත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම අවශ්‍ය නොවේ. | **2025 ජනවාරි 31 දින හෝ ඊට පෙර** |



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

| | | | |
|---|---|---|---|
| 4.9 | තවදුරටත් ගිණුම්වල ඇති වැරදි නිවැරදි කිරීම් ඇතුළත් දෙවන හා අවසන් පරිපූරක ගිණුම් සාරාංශය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම | 2024 වර්ෂයට අදාළ සියලු නිවැරදි කිරීම් CIGAS වැඩසටහනට ඇතුළත් කර දෙවන හා අවසන් පරිපූරක ගිණුම් සාරාංශය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. | **2025** ජනවාරි **31** දින හෝ ඊට පෙර |
| 4.10 | දෙවන පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම | දෙවන හා අවසන් පරිපූරක ගිණුම් සාරාංශයේ ඇතුළත් නිවැරදි කිරීම් හා මු.රෙ. 69 මාරු කිරීම් ඇතුළත් කර දෙවැනි පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කරනු ලැබේ. | **2025** පෙබරවාරි **05** දින |
| 4.11 | භාණ්ඩාගාර මෙහෙයුම්, තැපැල්, දේශීය ආදායම්, රේගු, දුම්රිය, රාජ්‍ය ව්‍යාපාර යන දෙපාර්තමේන්තු විසින් ජර්නල් සටහන් ඉදිරිපත් කිරීම | ඉහත දෙවන පරිපූරක භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනයන්හි සඳහන් තොරතුරු අනුව අවශ්‍ය ජර්නල් සටහන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. | **2025** පෙබරවාරි **06** දින හෝ ඊට පෙර |
| 4.12 | **2024** වර්ෂය සඳහා වූ අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම | හඳුනාගන්නා ලද සියලු ගිණුම් දෝෂ නිවැරදි කිරීම් හා ගිණුම්වල අදාළ මාරුකිරීම් සඳහා වූ ජර්නල් සටහන් ඇතුළත් කරමින් අවසන් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම ගිණුම් ප්‍රකාශන ලබාගැනීම සම්බන්ධයෙන් මෙහි 3.4 ඡේදයේ උපදෙස් අනුව ක්‍රියාකළ යුතු ය. | **2025** පෙබරවාරි **07** |



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

| | | | |
|---|---|---|---|
| 4.13 | අත්තිකාරම් ගිණුම් | සියලුම අත්තිකාරම් ගිණුම්වල මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒවායේ අනු පිටපත් රාජ්‍ය ගිණුම් හා ජාතික අයවැය දෙපාර්තමේන්තු වෙත යොමු කළ යුතු ය.<br><br>මු.රෙ. 506(ඇ) ප්‍රකාරව 2023 වර්ෂයේ නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 03/2023 පරිදි සකස් කරනු ලබන රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුම වාර්ෂික සැසඳුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී දෘඪ පිටපතට අමතරව මෘදු පිටපතක් loaninfor@sad.treasury.gov.lk ඊමේල් ලිපිනයට එවිය යුතු ය. | **2025 පෙබරවාරි 28** දින හෝ ඊට පෙර |

5. ඒ අනුව, සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පළාත් සභා විසින් මෙම මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් නිසි පරිදි අනුගමනය කළ යුතු බව අවධාරණය කෙරේ.

6. මෙම මාර්ගෝපදේශය සම්බන්ධව තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මූල්‍ය වාර්තාකරණ) දුරකථන අංක 0112484733, අධ්‍යක්ෂ (රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන හා කළමනාකරණ තොරතුරු) දුරකථන අංක 0112484649, අධ්‍යක්ෂ (ITMIS) දුරකථන අංක 0112484765, අධ්‍යක්ෂ (පද්ධති සංවර්ධන, පුහුණු) දුරකථන අංක 0112484826, අධ්‍යක්ෂ (වැටුප් මෘදුකාංග කළමනාකරණ) දුරකථන අංක 0112034516 ඇමතීමෙන් ලබාගත හැකිය.

ඩබ්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
3. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ - ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk